බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை
SECRETARIAT OF THE GOVERNOR - WESTERN PROVINCE
" ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක් "

ඔබේ අංකය. / உமது இல. / Your Ref. 1/4/2/5/78
මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/4/7/297
දිනය / திகதி / Date 2016.09. 13

15 SEP 2016

19 SEP 2016

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
109, මහ විදිය
බත්තරමුල්ල,

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>

උක්ත මැයෙන් යුතු ඔබේ සමාංක හා 2016.08.24 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය 2016.09.13 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

අනුමත කරන ලද අදාළ ව්‍යාවස්ථාවේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

අ/කලේ - පී.සෝමසිරි,
බ.ප .ආණ්ඩුකාර ලේකම්.

ජේ.සී.ජයලාල්,
පරිපාලන නිලධාරී.

පිටපත් : 1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) — අනුමත කරන ලද යථෝක්ත ව්‍යාවස්ථාවේ පිටපත් දෙකක් මේ සමග ඔබවෙත එවමි.

* පිළිතුරු සැපයීමේදී කරුණාකර ඉහත සඳහන් අංකය සඳහන් කරන්න. / பதில் அனுப்பும் போது தயவுசெய்து இலக்கத்தையும், திகதியையும் குறிப்பிடவும் / Please indicate my reference in the reply

| ලිපිනය / முகவரி Address | 109,. 5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.<br>109, 5ம் மாடி, ரொட்டுண்டா கோபுரம், காலி வீதி, கொழும்பு - 03<br>109, 5th Floor, Rotunda Tower, Galle Road, Colombo 03 | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුකාර ලේකම් /ஆளுநரின் செயலாளர் Secretary to the Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary | පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administartive Officer | කාර්යාලය / அலுவலகம் / Office |
| දුරකථන / தொலைபேசி / Telephone | 0112334097 | 0112334737 | 011 3159587 | 0112334347 / 0112334348 |
| ෆැක්ස්/ பெக்ஸ் / Fax | 0112334098 | 0112334738 | | |
| විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail | secretary@governor.wp.gov.lk | as@governor.wp.gov.lk | ao@governor.wp.gov.lk | cma@governor.wp.gov.lk info@govsec.wpc.gov.lk |

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : ----

1.2 අමාත්‍යාංශය : ----

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම
යොමු අංකය : ඩීඑම්එස්/ඩී/පොදු/11-2
දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය
යොමු අංකය : CSO/PTR/15/3/1
දිනය : 2016-08-11

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :
දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : 1/4/2/5/78
දිනය : 2016.08.24

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය
යොමු අංකය :
දිනය :

අනුමත කරමි / නොකරමි
2016/9/13
දිනය
කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත

**02. පත්කිරීම් බලධරයා** : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ක්‍රියාත්මක වන දිනය : ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/4/2/5/78 දිනය 2016/9/14

**03. සේවා ගණය පිළිබඳ විස්තර** :

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III ,II හා I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය

බස්නාහිර පළාතේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතනවල විෂයය පථයට අයත් රාජ්‍ය ආයතනවලට අදාළ පනත්, ප්‍රඥප්ති, අතුරු ව්‍යවස්ථා, රීති හා ගිවිසුම් සංශෝධනය කිරීමේ දී හා අලුතෙන් ඇති කිරීමේ දී ඒවා කෙටුම්පත් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය, මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම සහ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරි විෂයපථයට අදාළ කරුණක් මත නිලධාරීන් වගඋත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නඩු සඳහා සහභාගී වීම වැනි නෛතික කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

**04.** තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව SL 1 - 2016

5.2 වැටුප් පරිමාණය : 47,615/ - 1,335 X 10 - 1,630 X 8 - 2,170 X 17 - 110,895/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 1 | 47,615/- |
| II | පියවර 12 | 62,595/- |
| I | පියවර 20 | 76,175/- |

**සටහන:**

බඳවා ගැනීම්, උසස්කිරීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී අංක 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ, උපලේඛන II හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියේ සඳහන් කළ යුතුය.

**06.** සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් | |
|---|---|---|---|---|
| ප්‍රධාන නීති නිලධාරි | I | 01 | බස්නාහිර පළාත් සභාවේ ආයතනයන්හි නීතිමය කටයුතු වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම, අධිකරණ කටයුතුවල දී අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම හා නීති ඒකකයේ නිලධාරීන් අධීක්ෂණය හා මෙහෙයවීම, නීති ඒකකයේ ප්‍රධානියා වශයෙන් නීතිමය කටයුතු වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව වෙත වගවීම. | |
| නීති නිලධාරි | III , II | 20 | i. | බස්නාහිර පළාත් සභාව යටතේ පවතින සියලුම අමාත්‍යාංශ හා සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව පවරන නඩුවල දී හා පළාත් සභාවේ ආයතන විසින් වෙනත් පාර්ශ්වයන්ට පවරන නඩුවල දී පෙනී සිටීම |
| | | | ii. | අවශ්‍ය අවස්ථාවල දී නීතිපති වෙත නිරීක්ෂණ හා වාර්තා සැපයීම සහ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වාගෙන යාම |
| | | | iii. | අවශ්‍ය අවස්ථාවලදී පෙරකලාසි, විත්තිවාචක, විරෝධතා, ප්‍රතිවිරෝධතා, උත්තර, ලිඛිත දේශන ආදිය සැකසීම. |
| | | | iv. | පැමිණිලි හා චෝදනා පත්‍ර සකස් කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :...1/5/5/46 දිනය :...4.14./.91.13

| | | | | |
|---|---|---|---|---|
| | | | v. | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්ගේ උපදෙස් අනුව වෙනත් ආයතන මගින් ඉදිරිපත් කරන ඔප්පු , බදු ඔප්පුවල නිවැරදිතාව පිරික්සීම හා ගිවිසුම්පත් සැකසීම. |
| | | | vi. | ප්‍රඥප්ති , අතුරු ව්‍යවස්ථා සහ රීති නියෝග කෙටුම්පත් කිරීම සහ අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම. |
| | | | vii | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන විසින් ඉදිරිපත් කරන ගැටලු සඳහා නීති උපදෙස් ලබා දීම. |
| | | | viii | අවශ්‍ය අවස්ථාවලදි අධිකරණයන්හි පෙනී සිටීම සහ සියලු නඩු කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම |
| | | | ix. | අදාළ ආයතනයන් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බඩ්ස්මන්වරයා ඇතුළු වෙනත් ආයතන වෙතින් ඉදිරිපත් වන පැමිණිලිවලට අදාළ වාර්තා සැපයීම සහ අදාළ පරීක්ෂණවලට පෙනී සිටීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ප්‍රධාන නිති නිලධාරි - 01

නීති නිලධාරි - 20

(උප ලේඛනය 01)

සටහන :
ශ්‍රේණිගත උසස්වීම් සඳහා සේවා ගණයේ III,II හා I ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/4/4/59 දිනය 2016/9/13

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | - |

පුරප්පාඩු සංඛ්‍යාව 02ක් හෝ ඊට අඩුවන අවස්ථාවල දී සීමිත ධාරව යටතේ බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

## 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම

හෝ

නීති විද්‍යාලයේ අවසන් පරීක්ෂණ සමත් වී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම

7.2.2.2 පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් තිබීම

7.2.2.3 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකු ම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.4 වෙනත්

i. ශ්‍රී ලාංකිකයෙකු වීම.

ii. යහපත් චරිතයකින් යුක්ත වීම.

iii. අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර තුන (03)ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :...1/4/4/49 දිනය :....20../4/9/13

iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාග ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| නීතිය | 100 | 40 |
| සාමාන්‍ය බුද්ධිය | 100 | 40 |

( ලිඛිත විභාගයේ විෂය නිර්දේශය **ඇමුණුම අංක 01** හි දැක්වේ)

7.2.4.1.1 පවත්වන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :
ලකුණු ලබා දෙනු නොලැබේ මූලික සුදුසුකම් හා සහතික පරීක්ෂාව පමණක් සිදු කෙරේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :..1/5/4/... දිනය :...2016/9/13

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. මීට අමතරව වෙබ් අඩවියේ ද දැන්වීම් පළ කිරීමට හැකිය.

**7.3 සීමිත බඳවා ගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ සංවර්ධන නිලධාරි(නීති) තනතුරක් දැරීම
**සහ**
නීති විද්‍යාලයේ අවසන් පරීක්ෂණ සමත් වී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම

7.3.2.2 පළපුරුද්ද

නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව නීති කටයුතු පිළිබඳ වසර තුන (03)ක පළපුරුද්දක් තිබීම

7.3.2.4 වෙනත්

i. යහපත් චරිතයකින් යුක්ත වීම.

ii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව
7.3.3.2 උපරිම සීමාව
දැනට සේවයේ නියුතුවූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාවන් අදාළ නොවේ

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාග ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| නීතිය | 100 | 40 |
| සාමාන්‍ය බුද්ධිය | 100 | 40 |

( ලිඛිත විභාගයේ විෂය නිර්දේශය **ඇමුණුම අංක 01** හි දැක්වේ)

7.3.4.1.1 පවත්වන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :
ලකුණු ලබා දෙනු නොලැබේ මූලික සුදුසුකම් හා සහතික පරීක්ෂාව පමණක් සිදු කෙරේ.

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. මීට අමතරව වෙබ් අඩවියේ ද දැන්වීම් පළ කිරීමට හැකිය.

**7.4** **කුසලතා පදනම මත බඳවා ගැනීම** : අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට පත් වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය **(ඇමුණුම අංක 02)** |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය **( ඇමුණුම අංක 03)** |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය **( ඇමුණුම අංක 04)** |

සංලක්ෂ්‍යය :

පෙර පැවති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය යටතේ 1 හා 2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් ව ඇති නිලධාරීන් ඉහත 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූවා සේ සැලකේ.

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?

වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය අනුව

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින් |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/29 දිනය : 2016/9/13

## 09. භාෂා ප්‍රවීණතාවය

9.1

| | භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|---|
| 1. | රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. | අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. | සන්ධාන භාෂාව | අ.පො.ස (සා.පෙ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් සමත් විය යුතුය |

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

#### 10.1.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

##### 10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. තනතුරෙහි ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයෙහි III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

##### 10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්වීම් බලධරයා විසින් හඳුන්වා දෙනු ලැබූ නියමිත ආකෘතිය **(ඇමුණුම අංක 06)** මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සුදුසුකම් සපුරාලන දිනය හෝ III ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/2/9/49 දිනය : 2016/8/13

සංලක්ෂ්‍යය :
මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට නීති නිලධාරි III ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් 2007.04.24 දිනැති ව අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව II ශ්‍රේණියට උසස් කිරීමේ දී සලකා බලන අනෙකුත් අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් ද පුරප්පාඩු සැලකීමෙන් තොරව එසේ අවුරුදු 10 සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කෙරේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

### 10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

#### 10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

ii. සේවා ගණයෙහි II ශ්‍රේණියේ වසර 07ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 07ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/1/5/4 දිනය : 2016/09/13

iv. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

සංලක්ෂ්‍යය :
ඉහත අංක (i) යටතේ දැක්වෙන සුදුසුකම වෙනුවට මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේ දී පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පහත සුදුසුකම අදාළ වේ.

නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධියකට සමාන නීති ඩිප්ලෝමාව හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි නීති ඩිප්ලෝමාව හෝ මානව සම්පත් කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට සමාන විභාගයක් සමත් ව තිබීම

#### 10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්වීම් බලධරයා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘතිය **(ඇමුණුම අංක 06)** මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සුදුසුකම් සපුරාලන දිනය හෝ II ශ්‍රේණියේ වසර 07ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දෙකෙන් පසුව එළඹෙන දින සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම : අදාළ නොවේ.

## 11. තනතුරුවලට පත් කිරීම :

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| ප්‍රධාන නීති නිලධාරි | I ශ්‍රේණියේ නීති නිලධාරියෙකු වීම | බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පත් කරනු ලැබේ. **(ඇමුණුම අංක 05)** |

## 12. බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද , බස්නාහිර පළාත් සහා මූල්‍ය රීති සංග්‍රහයට ද , කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද , බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

## 13. බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ

බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ ඇතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/5/2/49 දිනය : 2016/09/13

## 14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට නීති නිලධාරි III ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයක් සපුරා නොමැති නිලධාරීන් ද නීති නිලධාරි III ශ්‍රේණියේ සිටින නිලධාරීන් ද නීති නිලධාරි III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට නීති නිලධාරි II ශ්‍රේණියේ වසර 07 ක සේවා කාලයක් සපුරා නොමැති නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

__I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම__

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට නීති නිලධාරි II ශ්‍රේණියේ වසර 07 ක සේවා කාලයක් සපුරා ඇති හා 2007.04.24 දිනැති ව අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස් කිරීමේ දී සලකා බලන ලද අනෙකුත් අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් ද නීති නිලධාරි I ශ්‍රේණියේ සිටින නිලධාරීන් ද නීති නිලධාරි I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සටහන :

- ඉහත විධිවිධාන යටතේ අන්තර්ග්‍රහණ කරන ලද නිලධාරීන් අදාළ ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. පැරණි පරිපාටිය යටතේ නියමිත ශ්‍රේණිවලට අදාළව දැනටමත් කාර්යක්ෂමතා කඩඉම් සමත් නිලධාරීන් නව පරිපාටිය යටතේ ඉන් සමත් වූවා සේ සැලකේ.

- අන්තර්ග්‍රහණය කරන දිනට අන්තර්ග්‍රහණය කරන ශ්‍රේණියට අවශ්‍ය සේවා කාලයට වඩා වැඩිපුර සේවය කර ඇති කාලය ඊළඟ ඉහළ ශ්‍රේණියට උසස් කිරීමේදී අවශ්‍ය සේවා කාලය සඳහා සලකා බලනු ලැබේ

- අන්තර්ග්‍රහණය මත නිලධාරීන්ගේ වැටුප් පියවරෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

**15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැන නගින අවස්ථාවක දී හා /හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :...1/4/5/[illegible] දිනය :...2016/9/13

**16. අර්ථ නිරූපණ**

__සතුටුදායක සේවා කාලය__

පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

සක්‍රිය සේවා කාලය

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

නියමිත දිනට

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය , " නියමිත දිනය " ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**17. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් බල පැවැත්විය යුත්තේ, සිංහල භාෂාවෙන් වන පාඨයන් වේ.**

සකස් කළේ: අත්සන ..........PTR/15

පරීක්ෂා කළේ :..........
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)
පරිපාලන නිලධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත් සභාව

නිර්දේශ කර ඉදිරිපත් කරමි

දිනය : 2016/08/09

අත්සන ..........

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම

තනතුර

නිල මුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

... විසින් අනුමත කරන ලදී. ... අංකය : ... දිනය : 2016/9/13

යොමු අංකය: **CSO/PTR/15/3/1**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙහි නීති නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2016-08-11

අත්සන : ..........

නම : ..........

ප්‍රධාන ලේකම් (බ.ප)

නිල මුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග

යොමු අංකය : 1/4/2/5/78

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙහි නීති නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය : 2016. 08. 24.

අත්සන : ..........................................
නම : ..........................................
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය:

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙහි නීති නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය 2016 . 09 . 13 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

දිනය : 2016 . 09 . 13

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/4/1/249 දිනය : 2016/9/13

අත්සන : ..........................................
නම : ..........................................
ආණ්ඩුකාර ලේකම්
නිල මුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
05වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල,
අංක: 109, ගාලු පාර, කොළඹ 03.

ඇමුණුම අංක : 01

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය (සීමිත/ විවෘත) පිළිබඳ විස්තර</u>**

1. විභාගයේ නම :
   බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය (සීමිත /විවෘත)

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| නීතිය | පැය 02 | 100 | 40 |
| සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය අනුව

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| නීතිය | • ශ්‍රී ලංකාවේ නීති ක්‍රම<br>○ ගිවිසුම් නීතිය<br>○ නියෝජ්‍යත්ව නීතිය<br>○ පරිපාලන නීතිය<br>ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය හා අධිකරණ සංවිධානය<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව(විශේෂයෙන් 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරේ.)<br>• මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් |
| සාමාන්‍ය බුද්ධිය | පදගත, සංඛ්‍යාත්මක සහ රූපකාර සන්දර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධ අයදුම්කරුවන්ගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලොනු අංකය : 1/5/4/2-97 දිනය : 2014/9/13

අත්සන ....................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම ....................
තනතුර ....................
දිනය 2016/08/09
නිල මුද්‍රාව ....................

සිරිසෝම ලොකුවිතාන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

ඇමුණුම අංක : 02

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරේ III වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ විස්තර

1. පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරේ III වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා අණපනත් | පැය 02 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
   බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :
   වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා අණපනත් | ආයතන සංග්‍රහයේ I හා II කොටස්, කාර්ය පරිපාටික රීති හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,1987 අංක 42 දරණ පළාත් සභා පනත හා අදාළ සංශෝධන, මහ නගර සභා ආඥා පනත, නගර සභා හා ප්‍රාදේශීය සභා පනත් |
| මුදල් රෙගුලාසි | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, බස්නාහිර පළාත් මූල්‍ය රීති, පළාත් පාලන ආයතන සඳහා වන මූල්‍ය රීති, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/3/5/4-97. දිනය :...2016/12/13

අත්සන ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම ..................
තනතුර ..................
දිනය 2016/08/09
නිල මුද්‍රාව
සිරිසෝම ලොකුවිතාන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

ඇමුණුම අංක : 03

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරේ II වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ විස්තර</u>

1. පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරේ II වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| නීතිය | පැය 03 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
   බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :
   වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| නීතිය | විෂය පථයට අදාළ පළාත් පාලනය පිළිබඳ අණපනත්, බස්නාහිර පළාත් සභා ප්‍රඥප්ති, ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය, අධිකරණ සංවිධාන, ශ්‍රී ලංකාවේ උසාවි ආඥා පනත(6 පරිච්ඡේදය), 1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනත, දණ්ඩ නීති සංග්‍රහය, සාක්ෂි ආඥා පනත, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය පරිපාලනය සම්බන්ධ අධිකරණ බලය, ශ්‍රී ලංකා රාජ්‍ය තන්ත්‍රයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම, රජය හා පළාත් සභාවේ අත්සන් තබන ලද ගිවිසුම් සම්බන්ධයෙන් අවශ්‍ය වන නීතිමය කරුණු, නිල නිවාස වල අනවසර හා බලහත්කාර පදිංචිවීම්වලට අදාළ පනත්, රාජ්‍ය ප්‍රතිපත්තිය උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හා මූලික යුතුකම්. අභිනියෝජන අවස්ථා, රජයේ හා රාජ්‍ය අධිකාරීන්හි වගකීම් |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/2/5/497 දිනය : 2016/9/15

අත්සන ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම ..........................................
තනතුර ..........................................
දිනය 2016/08/09
නිල මුද්‍රාව ..........................................

ඇමුණුම අංක : 04

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරේ I වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ විස්තර**

1. පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුරේ I වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 02 | 100 | 40 |
| මූල්‍ය කළමනාකරණය | පැය 02 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
   බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :
   වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | • කළමනාකරණ මූලධර්ම<br>• කළමනාකරණ ශ්‍රිතයන්<br>• සහභාගීත්ව කළමනාකරණය හා කළමනාකරණ පරිසරය<br>• කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම |
| මූල්‍ය කළමනාකරණය | • ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය<br>• රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන<br>• රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය<br>• පළාත් සභා මූල්‍ය පාලනය<br>• පළාත් සභාවේ මූල්‍ය කළමනාකරණය සකස් වී ඇති ආකාරය<br>• පළාත් සභාවේ අරමුදල් හා අරමුදල් ලැබෙන ප්‍රභවයන් |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය : 2016/9/15
ගොනු අංකය : ...

අත්සන ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම ..............................
තනතුර ..............................
දිනය ....2016/08/09....
නිල මුද්‍රාව ....සිරිසෝම ලොකුවිතාන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

## ප්‍රධාන නීති නිලධාරි තනතුරට පත්කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පිළිබඳ විස්තර

1. පරීක්ෂණයේ නම : ප්‍රධාන නීති නිලධාරි තනතුරට පත්කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 20 | |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | | |
| • පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | | |
| • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | | |
| • දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | | |
| නීති විද්‍යාලයේ අවසාන වසරේ | | | |
| • පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | | |
| • දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | | |
| (උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙන අතර උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම් වලින් එකක් පමණක් සලකා බලනු ලැබේ.) | | | |
| | | | |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | | 10 | |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | | 40 |
| | | | |
| එල්.එල්.එම් උපාධිය | | 20 | |
| පළපුරුද්ද | | 30 | |
| නීති නිලධාරි I පන්තියේ පළපුරුද්ද එක් වසරකට ලකුණු 05 බැගින් වසර 06 ක් සඳහා | | | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | | 15 | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම. (එක් පාඨමාලාවක් සඳහා ලකුණු 05 බැගින්) | | | |
| | | | |
| පෞරුෂය | | 05 | |
| | | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. ගොනු අංකය : 1/4/4/4-97 දිනය : 2014/9/13

3. සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇතිවන අවස්ථාවක හෝ අවශ්‍යතාවය පරිදි

අත්සන : ........ PTR ........

(විෂයභාර නිලධාරියා)

නම : එස්. කේ. ලියනගේ

තනතුර : කළමනාකරණ සහකාර

දිනය : 2016-08-09

පරීක්ෂා කළේ : අත්සන : ..........................

(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

නම : එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරි (පිරිස් හා පුහුණු)

තනතුර : ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත් සභාව

දිනය : 2016 | 08 | 09

අත්සන : ..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

සිරිසෝම ලොකුවිතාන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

නම : ..................................................

තනතුර : ..................................................

දිනය : 2016 | 08 | 09

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/7/4/292 දිනය : 2016/9/13

ඇමුණුම : 06

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක ගණයේ නීති නිලධාරි තනතුරට අදාළ ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත

1. නිලධාරියා පිළිබඳ තොරතුරු

| | | | |
|---|---|---|---|
| 1.1 | අයදුම්කරුගේ සම්පූර්ණ නම | : | ........................................................................ |
| 1.2 | හැඳුනුම්පත් අංකය | : | ........................................................................ |
| 1.3 | සේවා ස්ථානය සහ එහි ලිපිනය | : | ........................................................................ |
| 1.4 | අයත් වන සේවය හා තනතුර | : | ........................................................................ |
| 1.5 | අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය | : | ........................................................................ |

2. පත්වීම පිළිබඳ තොරතුරු

| | | | |
|---|---|---|---|
| 2.1 | පත්වීම් දිනය | : | ........................................................................ |
| 2.2 | පත්වීම ස්ථිර කළ දිනය | : | ........................................................................ |

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතාව මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :..1/4/1/29 දිනය :..2019/9/13

3. උසස් වීමට අදාළ තොරතුරු

| | | | |
|---|---|---|---|
| 3.1 | උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය | : | II / I |
| 3.2 | උසස් වීමට අපේක්ෂිත ධාරාව | : | සාමාන්‍ය |

| | | | |
|---|---|---|---|
| 3.2.1 | අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? | : | ඔව් / නැත |
| 3.2.2 | සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය | : | ...................... |
| 3.2.3 | අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේ ද? | : | ඔව් / නැත |
| 3.2.4 | නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේ ද? | : | ඔව් / නැත |
| | උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? | | ඔව් / නැත |
| 3.2.5 | විනය දඬුවම් ලබා තිබේ ද? | : | ඔව් / නැත |

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය / සුවිශේෂී කාර්යසාධනය යටතේ II / I / විශේෂ ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................................ ....................................................................

නිලධරයාගේ අත්සන

5. <u>දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම් සඳහන් ..................................... මහතා / මිය / මෙනෙවිය ............................ සේවා ගණයේ ...........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය / සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව : ......................................................

6. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් /නිවැරදි නොවන බවත් ,ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් ,/ නොවන බවත්, කාරුණිකව දන්වමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව : ......................................................

7. <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඒ අනුව .......................................................... මහතා / මිය / මෙනෙවිය ............................ සේවා ගණයේ ...........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය / සුවිශේෂී කාර්යසාධනය යටතේ ............................ දින සිට උසස් කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...1/5/4/2-1 දිනය : ....2016/9/13

අත්සන : ..........................................................

නිල මුද්‍රාව : ......................................................

උපලේඛන **01**

| අනු අංකය | ස්ථානය | අනුමත නිලධාරි සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රධාන ලේකම් කාර්යාලය<br>ප්‍රධාන නීති නිලධාරි - 01<br>නීති නිලධාරි - 06 | 07 |
| 2. | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 01 |
| 3. | කොළඹ මහ නගර සභාව | 06 |
| 4. | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | 01 |
| 5. | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | 02 |
| 6. | මොරටුව මහ නගර සභාව | 01 |
| 7. | කඩුවෙල මහ නගර සභාව | 01 |
| 8. | ගම්පහ මහ නගර සභාව | 01 |
| 9. | මීගමුව මහ නගර සභාව | 01 |
| | එකතුව | 21 |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :...1/4/4/2-92 දිනය :...2014/4/13